// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2466/13 – 2025 දෙසැම්බර් මස 09 වැනි අඟහරුවාදා – 2025.12.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ඡේදයේ විස්තර කරනු ලබන පරවශතාවය පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාවය අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින්ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

1. **පරවශතාවේ විස්තරය** - කුණ්ඩසාලේ හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ නෙල්ලිගල සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය (වැරැල්ලගස්වැව) සඳහා ඉඩම් කොටස්වල පරවශතා අයිතිය අත්කර ගැනීම.

2. **ඉඩමේ විස්තරය** - මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙගල්දොරුව (652) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙගල්දොරුව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක Maha/ KND/2022/168 හා 2022.05.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැලිවලට මායිම්:

**01. කැබලි අක්ෂර A - ප්‍රමාණය: හෙක්. 0.0267 ක් පමණ**

උතුරට: එස්.බී.කන්ස්ට්‍රක්ෂන් හිමිකම් කියන වැරැල්ලගස්වැව එච්.එම්.ඒ.බී.හේරත් හිමිකම් කියන වැරැල්ලගස්වැව සහ එන්.වික්‍රමසූරිය හිමිකම් කියන වැරැල්ලගස්වැව; නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ එන්.වික්‍රමසූරිය හිමිකම් කියන වැරැල්ලගස්වැව; දකුණට: එන්.වික්‍රමසූරිය හිමිකම් කියන වැරැල්ලගස්වැව, ජී.රත්නසිංහ හිමිකම් කියන වැරැල්ලගස්වැව, එම්.එල්.ගුණසිංහ හිමිකම් කියන වැරැල්ලගස්වැව සහ කැබලි අක්ෂර B; බටහිරට: ජී. රත්නසිංහ හිමිකම් කියන වැරැල්ලගස්වැව එම්.එල්.ගුණසිංහ හිමිකම් කියන වැරැල්ලගස්වැව, කැබලි අක්ෂර B සහ මාර්ගය.

**02. කැබලි අක්ෂර B - වැරැල්ලගස්වැව - ප්‍රමාණය: හෙක්. 0.0332 ක් පමණ**

උතුරට: එම්.එල්.ගුණසිංහ හිමිකම් කියන වැරැල්ලගස්වැව සහ කැබලි අක්ෂර A; නැගෙනහිරට, දකුණට සහ බටහිරට: එම්.එල්. ගුණසිංහ හිමිකම් කියන වැරැල්ලගස්වැව.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2021/WS/238.
2025 සැප්තැම්බර් 26 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර"
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 12-0045

1A – G 045851 – 13 (2025/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*